ජනාධිපති කාර්යාලය
ජනාதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/SP/SB/3/3/2019
චක්‍රලේඛ අංකය : PS/SP/SB/Circular/3/2019

2019 දෙසැම්බර් මස 02 වන දින

**සියළු අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත**
**සියළු දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත**

**රට පුරා විවිධ දිස්ත්‍රික්කයන්හි ඇතිවී ඇති ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් සහන සැලසීම**

අයහපත් කාලගුණය හේතුවෙන් මේ වන විට රට පුරා විවිධ දිස්ත්‍රික්කයන් වෙත බලපා ඇති ගංවතුර, නායයෑම් හා අනෙකුත් ආපදා තත්ත්වයන්හි දී මහජනයාගේ ආරක්ෂාව සහ සුභසාධනය තහවුරු කරලීම සම්බන්ධයෙන් ගත යුතු සියළු ක්‍රියාමාර්ගයන් නොපමාව ගැනීමට කටයුතු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මෙයින් දන්වමි.

පවතින අධික වර්ෂා තත්වය හේතුවෙන් ඇති වන නායයෑම්, පස් කඳු කඩා වැටීම්, ගල් පෙරලීම් වැනි අවදානම් තත්ත්වයන්ට මුහුණ දීම පිණිස ආරක්ෂක අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් ආපදා අවම කිරීමට සහ කඩිනම් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හා වාතාවරණය ඇති කළ යුතුය. මහජන සුභසාධනය සඳහා අවශ්‍ය ක්ෂණික පියවර ගන්නා ලෙස ද අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දී ඇත.

තවදුරටත් වර්ධනය විය හැකි අයහපත් කාලගුණික තත්ත්වයන් සහ එහි විපාක අවම කරගැනීම සම්බන්ධයෙන් මහජනයා පුළුල් ලෙස දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම කටයුතු සම්බන්ධීකරණය හා සමාලෝචනය සිදුකෙරෙනු ඇත.

මෙම චක්‍රලේඛ උපදෙස් ඔබ ආයතනය යටතේ ඇති සියළු ආයතන වෙතද දැනුම් දීමට කටයුතු කරන මෙන් දන්වන අතර මේ සම්බන්ධයෙන් දැනටමත් නිකුත් කර ඇති මාධ්‍ය නිවේදනයෙහි පිටපතක් ද මේ සමඟ අමුණා ඇත.

**පී බී ජයසුන්දර**
ජනාධිපති ලේකම්

පිටපත:

1. අග්‍රාමාත්‍ය ලේකම්
2. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
3. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
4. අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

} අවශ්‍ය කටයුතු ප්‍රමුඛත්වයෙන් ඉටු කිරීම සඳහා

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk